සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# තෙවන වාර පරීක්ෂණය
# மூன்றாம் தவணைப் பரீட்சை - 2026
# Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 13 | විෂයය / பாடம் / Subject } චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper } I | කාලය / மணித்தியாலம் / Hours } පැය 03 |

උපදෙස් :
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.
I **කොටස**
ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.** එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.
II **කොටස**
අනු කොටස් **තුනකින්** සමන්විත ය. '**අ**' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා '**ආ**' සහ '**ඉ**' යන දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
I කොටස හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න අංක **1 සිට 5** තෙක් එක් එක් ප්‍රශ්නවලට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

**1.** ශ්‍රී ලංකාවේ ස්තූපය හා සම්බන්ධ කලා නිර්මාණාංගයක් වන **"ආදි මුඛ"** නමින් අතීතයේ හැඳින්වූයේ,
(1) සඳකඩ පහණයි. (2) පුන්කලසයි. (3) වාහල්කඩයි.
(4) කොරවක්ගලයි. (5) මුරගලයි යි. (...............)


**2.** මොන්ගෝලියානු හා ශෛලිගත ලක්ෂණ සහිත ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ මූර්තිය වන්නේ,
(1) නලගන රුවයි. (2) අළු වැලි ගලින් කළ කවන්ද රුවයි.
(3) පූජක රුවයි. (4) රතු වැලි ගලින් කළ කවන්ද රුවයි.
(5) පශුපති රුවයි. (...............)


**3.** යමක් පිළිගැනීමට සිටින ආකාරයෙන් ප්‍රතිග්‍රහණ මුද්‍රාවෙන් බුදුන් වහන්සේ දක්වා ඇත්තේ,
(1) හිඳගල සිතුවම් අතරය. (2) මහියංගන ධාතු ගර්භයේ සිතුවම් අතරය.
(3) ගොනාගොල්ල සිතුවම් අතරය. (4) වෙස්සගිරිය සිතුවම් අතරය.
(5) පුල්ලිගොඩ සිතුවම් අතරය. (...............)


**4.** මිසරයේ නෙෆර්ටිටි උඩුකය මූර්තිය,
(1) පැරණි රාජධානි සමයට අයත් අකිනේටන් රජුගේ බිසවයි.
(2) නව රාජධානි සමයට අයත් කාන්තා රූපයක් වුවද තේජස නිරූපිත මූර්තියකි.
(3) පැරණි රාජධානි සමයට අයත් රාජිණියගේ උඩුකය මූර්තියකි.
(4) නව රාජධානි සමයට අයත් අකිනේටන් රජුගේ බිසවයි.
(5) පැරණි රාජධානි සමයට අයත් රූප රාජිනියකගේ උඩුකය මූර්තියකි. (...............)

**5.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ දී "ඇක්විඩක්ට්" යනුවෙන් හැඳින්වූයේ,
(1) හරප්පා ප්‍රධාන නගරයේ නාගරික සැලසුම් ක්‍රමයයි. (2) ඇතුල් නගරයේ තටාකයට ජලය ගෙනගිය ජල මාර්ගයයි.
(3) මාර්ග ප්‍රධාන දිශාවලට අනුගත කර ඇති ආකාරයයි. (4) පිටත නගරයේ ඉතා ක්‍රමවත් ලෙස ඉදි කළ මාර්ගයයි.
(5) මාර්ගවල පදික වේදිකාවට යටින් ඇති ජල අපවහන පද්ධතියයි. (...............)

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති වලට **වඩාත් ගැළපෙන පිළිතුර** අංක 1 සිට 9 තෙක් අංක කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


1


2


3


4


5


6


7


8


9

**6.** ශ්‍රී ලාංකේය ශිල්පීන්ගේ සිතුවම් වන්නේ,

(1) 1,2,4 (2) 1,7,9 (3) 2,5,6 (4) 2,8,9 (5) 3,7,8 (...............)

**7.** පෝල් ගොගැන්ගේ හා නන්දලාල් බෝස්ගේ සිතුවම් වන්නේ,

(1) 3,8 (2) 4,6 (3) 4,7 (4) 5,9 (5) 7,6 (...............)

**8.** උපස්ථිතිවාදී සිතුවමක් හා ඝනිකවාදී සිතුවමක් වන්නේ,

(1) 2,6 (2) 3,5 (3) 4,9 (4) 5,6 (5) 7,8 (...............)


**9.** පැබ්ලෝ පිකාසෝගේ සිතුවමක් හා ඔහුගෙන් ආභාසය ලැබූ ශ්‍රී ලාංකේය ශිල්පියකුගේ සිතුවමක් වන්නේ,


(1) 2,3 (2) 4,5 (3) 5,6 (4) 6,8 (5) 6,9 (...............)

**10.** මෙම සිතුවම් අතුරින් ගුහා සිතුවමක් හා විහාර සිතුවමක් වන්නේ,

(1) 1,7 (2) 2,6 (3) 4,9 (4) 5,6 (5) 7,8 (...............)

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

**11.** A අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) යථාර්ථවාදී රීතියට අනුව මුදලිඳු ඒ. සී. ජී. එස්. අමරසේකර තෙල් සායමින් ඇඳි චිත්‍රයකි.
(2) යුරෝපීය ස්වභාවිකවාදී ක්‍රමවේද අනුව ඉන්දීය ඌරුවක් සහිතව එම්. සාර්ලිස් ඇඳි චිත්‍රයකි.
(3) ශාස්ත්‍රාලීය කලාවේ මූලධර්මවලට අනුව ඩේවිඩ් පේන්ටර් දේශීය ඇඳුම් පැළඳුම් සහිතව ඇඳි චිත්‍රයකි.
(4) සෝලියස් මෙන්ඩිස් ඉන්දීය අජන්තා එල්ලෝරා භාග් කලා මූලයන් ගුරු කොට ඇඳි චිත්‍රයකි.
(5) යුරෝපීය ක්‍රමවේද අනුව ජේ. ඩී. ඒ. පෙරේරා ශාස්ත්‍රාලීය ආභාසයට අනුව ඇඳි සිතුවමකි. (...............)

**12.** B අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,

(1) වියළි බදාමය මත අඳින ලද අජන්තා අප්සරා රූපයකි.
(2) අජන්තා අප්සරා රූපවලට සමානකම් දක්වන සීගිරි සිතුවමකි.
(3) ෆ්‍රෙස්කෝ සිකෝ ක්‍රමයට අඳින ලද සීගිරි සිතුවමකි.
(4) ෆ්‍රෙස්කෝ ක්‍රමයට අඳින ලද අප්සරා රූපයකි.
(5) සීගිරි කාන්තා රූපවලට සමානකම් දක්වන අප්සරා රූපයකි. (...............)

**13.** C අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,

(1) අධියථාර්ථවාදී සැල්වදෝර් දාලිගේ සිතුවමකි.
(2) උපස්ථිතිවාදී වසිලි කන්දිස්කිගේ සිතුවමකි.
(3) අධිතාත්විකවාදී ෆ්‍රීඩා කාලෝගේ සිතුවමකි.
(4) ඝනිකවාදී ජෝර්ජස් බ්‍රාගේ සිතුවමකි.
(5) පශ්චාත් උපස්ථිතිවාදී පෝල් සෙසෑන්ගේ සිතුවමකි. (...............)


**14.** D අක්ෂරයෙන් දැක්වෙන ඩේවිඩ් පේන්ටර්ගේ සිතුවම,

(1) යුරෝපීය යථාර්ථවාදී කලා ලක්ෂණවල ආභාසය ස්වදේශික තේමා අනුව ඇඳ ඇත.
(2) ශාස්ත්‍රාලීය කලාවේ ක්‍රමවේද අනුව පමණක් අවධානය යොමු කරමින් සිතුවම ඇද ඇත.
(3) කිතුනු තේමාවක් ස්වදේශික මානව හා පරිසර පද්ධති සමඟ ගලපා නව අරුතකින් ඇද ඇත.
(4) මානව රූප ඇඳීමේ දී කායික සුන්දරත්වයට වඩා උපමා කතාවක් ඉදිරිපත් කිරීමට යත්න දරා ඇත.
(5) යුරෝපීය ආභාසය අනුව චිත්‍රයේ පසුබිම පෙරබිමට ගෙනැවිත් මනාව රූප සංරචනය කර ඇත. (...............)

**15.** E අක්ෂරයෙන් දැක්වෙන කාන්තා සිතුවම,

(1) අධිරාජ්‍යවරයාගේ අභිමතයට අනුව නිර්මාණය කරන ලද සිතුවමකි.
(2) මෝගල් හා රාජ්පුට් කලාවන්හි සම්මිශ්‍රණයේ ප්‍රතිඵලයකි.
(3) ආගමික නොවූ ලෞකික තේමාවක් අරමුණු කරගත් සංරචනයකි.
(4) ස්වදේශීය හින්දු ලක්ෂණ හා විදේශීය කලා ලක්ෂණ ගරු කොටගත් නිර්මාණයකි.
(5) හින්දු සාහිත්‍යයේ කෘතිවල එන වීර චරිත චිත්‍රයට නැගූ අවස්ථාවකි. (...............)

- ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන පිළිතුර** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම්කර ඇති කැටයම් ඇසුරෙන් තෝරන්න.




**F** **G** **H** **I** **J**

**16.** F අක්ෂරයෙන් දැක්වෙන කැටයම දැකගත හැක්කේ,

(1) ඇම්බැක්කේ දේවාලයේ පනේල කැටයම් අතරය. (2) රිදී විහාරයේ උළුවස්සේ කැටයම් අතරය.
(3) ගඩලාදෙණිය විහාරයේ පාදමේ කැටයම් අතරය. (4) යාපහුව දළදා මැදුරේ පාදමේ කැටයම් අතරය.
(5) පණාවිටිය අම්බලමේ පණේල කැටයම් අතරය. (...............)

**17.** G දැක්වෙන පෙම් යුවල කැටයම,

(1) රන්මසු උයනින් හමු වී ඇති අතර අර්ධ උන්නතව නෙළා ඇත.
(2) ජේතවන භූමියෙන් හමු වී ඇති අතර අල්ප උන්නතව නෙළා ඇත.
(3) අභයගිරි භූමියෙන් හමු වී ඇති අතර අධි උන්නතව නෙළා ඇත.
(4) කුට්ටම් පොකුණ අසලින් හමු වී ඇති අතර අල්ප උන්නතව නෙළා ඇත.
(5) ඉසුරුමුණි භූමියෙන් හමු වී ඇති අතර අර්ධ උන්නතව නෙළා ඇත. (...............)

**18.** H අක්ෂරයෙන් දැක්වෙන,

(1) යෝගාසන දේව රූපයේ මුහුණු දෙකක් නිරූපණය කරයි.
(2) කැටයමෙහි ඉන්දු නිම්න අක්ෂර යෙදීම විශේෂත්වයකි.
(3) යෝගාසන කැටයම වටා සත්ත්ව රූප දැකිය හැකිය.
(4) මුද්‍රා නිර්මාණය අං සහිත දෙවියා පශුපති නමින් ද හඳුන්වයි.
(5) කැටයමෙහි පශුපතිගේ යෝගී ඉරියව්වක් දැකිය හැකිය. (...............)

**19.** I අක්ෂරයෙන් දැක්වෙන භාරුත් කැටයමින්,

(1) අනේපිඬු සිටාණන් බුදුන් වහන්සේ සරණ යන අයුරු නිරූපණය කරයි.
(2) ගැල්කරුවන් ජේතවනාරාමයෙන් රන්කාසි ගෙන යාම නිරූපණය කරයි.
(3) අභයගිරි විහාරයේ වැසියන් රන්කාසි අතුරන අයුරු නිරූපණය කරයි.
(4) අනේපිඬු සිටාණන් අතපැන් වත් කොට ජේතවනය පූජා කිරීම නිරූපණය කරයි.
(5) බුදුන් වහන්සේ නිරූපණයට ශිල්පියා සංකේත භාවිත කළ බව නිරූපණය කරයි. (...............)


**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන කැටයම,

(1) කොන්ස්ටන්ටයින් අධිරාජයාගේ ජයග්‍රහණ සංකේතවත් කරන්නකි.
(2) රෝම විජයග්‍රහණ සැමරුම් සඳහා අතීත පාලකයන් විසින් ඉදිකරන ලද්දකි.
(3) ට්‍රැජන් අධිරාජයාගේ ඩේසියානු යුධ ජයග්‍රහණ සැමරීමට ඉදිකරන ලද්දකි.
(4) රෝම රජවරුන්ගේ විජයග්‍රහණ සංකේතවත් කරන ආරුක්කු කැටයමකි.
(5) ටයිටස් අධිරාජයාගේ යුධ ජයග්‍රහණ සැමරීමට ඉදිකරන ඉදිකරන ලද කුළුණු කැටයමකි. (...............)


- ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති මූර්ති රූප ඇසුරෙන් තෝරන්න.


**K**


**L**


**M**


**N**


**O**

**21. K** අක්ෂරයෙන් දැක්වෙන හිටි බුද්ධ ප්‍රතිමාව,
(1) ධාතුසේන රජතුමා අනුරාධපුරයේ තිසා වැව ආසන්නයේ ගල් පර්වතයක නෙළා ඇත.
(2) ස්වභාවික ගල් පර්වතයක අධි උන්නතව නෙළා ඇති අතර සමභංගව වැඩ සිටි.
(3) පූර්ණ උන්නතව නෙළා ඇති අතර සිරස්පත මහනුවර යුගයේ දී එක් වූ අංගයකි.
(4) කපා සකස් කරන ලද ගල් පර්වතයක අර්ධ උන්නතව නෙළා ඇති අතර සමභංගව වැඩ සිටි.
(5) හුණුගල් ප්‍රභේදයකට අයත් මිශ්‍ර පාෂාණ විශේෂයකින් නෙළා ඇති අතර ත්‍රිභංගව වැඩ සිටි. (...............)

**22. L** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
(1) සැබෑ ඉන්දීය ගති ලක්ෂණ සහිත ගුප්ත යුගයේ ලක්ෂණ පෙන්නුම් කරන බුද්ධ ප්‍රතිමාවකි.
(2) ඉන්දීය බුද්ධ ප්‍රතිමා අතර අමරාවතී සම්ප්‍රදායේ කලා ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රතිමාවකි.
(3) සම්මත මිනුම් ක්‍රමයන්ට අනුව නෙළන ලද මථුරා සම්ප්‍රදායේ ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රතිමාවකි.
(4) චූනාර් මාධ්‍ය භාවිතයේ ශිල්පියා දක්වන කුසලතාවය පෙන්නුම් කරන ලද ප්‍රතිමාවකි.
(5) බුදු රදුන් පස්වග මහණුන්ට දම්සක් දෙසීම තේමා වූ ගුප්ත සම්ප්‍රදායේ ප්‍රතිමාවකි. (...............)

**23. M** අක්ෂරයෙන් දැක්වෙන **"නම් නොකළ"** මූර්තිය,
(1) විශ්ලේෂණාත්මක ඝණිකවාදයේ ප්‍රයෝග දැකිය හැකිය.
(2) අධිතාත්විකවාදී කලා ලක්ෂණ නිරූපනයට උත්සාහ දරා ඇත.
(3) සංස්ලේෂණාත්මක ඝණිකවාදයේ ආභාසය පෙන්නුම් කරයි.
(4) වියුක්ත කලාවේ ලක්ෂණ අනුව නිර්මාණය කර ඇත.
(5) ශරීර අංග අතිශයෝක්තියට නගමින් නිරූපණය කර ඇත. (...............)

**24. N** අක්ෂරයෙන් දැක්වෙන කවන්ධ මූර්තිය,
(1) රතු වැලි ගලින් නෙළා ඇති අතර හරප්පාවෙන් හමු වවූකි.
(2) ලෝකඩ මාධ්‍යයෙන් නිර්මාණයකර ඇති අතර හරප්පාවෙන් හමු වූවකි.
(3) සුදු හුණුගලින් නෙළා ඇති අතර මොහෙන්ජොදාරෝවෙන් හමු වූවකි.
(4) අලු වැලි ගලින් නෙළා ඇති අතර හරප්පාවෙන් හමු වූවකි.
(5) කළු ගලින් නෙළා ඇති අතර මොහෙන්ජොදාරෝවෙන් හමු වූවකි. (...............)

**25. O** අක්ෂරයෙන් දැක්වෙන කලා කෘතියෙන්,
(1) අධිරාජ්‍යවාදී ස්වරූපයකින් නිරූපිත සාමාන්‍ය මිනිසකු නිරූපණය කරයි.
(2) කුරිරු පාලකයකුගේ ධාමරික ආවේගශීලී චරිතයේ ස්වභාවය නිරූපණය කරයි.
(3) අධිරාජ්‍යවාදියෙකුගේ පෞද්ගලික චරිත ලක්ෂණය ඉතා හොඳින් අවධාරණය කරයි.
(4) අධිරාජ්‍යවාදියෙකුගේ බාහිර ලක්ෂණ මැනවින් නිරූපණය කරයි.
(5) අධිරාජ්‍යවාදියෙකු සාමාන්‍ය මිනිසකුගේ ස්වරූපයෙන් නිරූපණය කරයි. (...............)

-

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** තෝරන්න.

**26**. පරණවිතාන මහතාට අනුව, ශ්‍රී ලංකේය වාහල්කඩෙහි සතුන් හතර දෙනා නිවැරදිව දිශාභිමුඛකර ඇති පිළිතුර වනුයේ,

(1) ඇතා - උතුර, අශ්වයා - දකුණ, සිංහයා - නැගෙනහිර, ගවයා - බටහිර.
(2) ඇතා - දකුණ, අශ්වයා - නැගෙනහිර, සිංහයා - බටහිර, ගවයා - උතුර.
(3) ඇතා - උතුර, අශ්වයා - දකුණ, සිංහයා - බටහිර, ගවයා - නැගෙනහිර.
(4) ඇතා - නැගෙනහිර, අශ්වයා - බටහිර, සිංහයා - උතුර, ගවයා - දකුණ.
(5) ඇතා - නැගෙනහිර, අශ්වයා - බටහිර, සිංහයා - උතුර, ගවයා - දකුණ. (...............)

**27.** **ජන්තාඝර** යනුවෙන් හඳුන්වන වාස්තු විද්‍යාත්මක අංගය,

(1) බුදුන් වහන්සේ වැඩ සිටි වජ්‍රාසනය සංකේතවත් කරවන ශෛලමය නිර්මාණ විශේෂයකි.
(2) භාවනායෝගී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් තනන ලද ගෘහ නිර්මාණ විශේෂයකි.
(3) ආරණ්‍යගත භික්ෂූන්ට භාවනා කිරීම සඳහා කරන ලද ගෘහ නිර්මාණ විශේෂයකි.
(4) බෝධිය වටා එහි ආරක්ෂාව සඳහා ඉදිකරන ලද ගෘහ නිර්මාණ විශේෂයකි.
(5) ආරණ්‍යවාසී භික්ෂූන් ස්නානය සඳහා භාවිත කරන ලද ගෘහ නිර්මාණ විශේෂයකි. (...............)

**28.** මයිකල් ආන්ජලෝ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද මෝසස් ප්‍රතිමාවේ දකුණු අතෙහි ඇත්තේ,

(1) ඍෂිවරයෙකු බව සංකේතවත් කරන පුස්කොල පොතකි.
(2) දස පණත සංකේතවත් කරන ගල් පුවරුවකි.
(3) සශ්‍රීකත්වය නිරූපණය කරන විය ගසකි.
(4) රාජ්‍යත්වය සංකේතවත් කරන වල්විදූනාවකි.
(5) පැරණි ලේඛන කලාව නිරූපණය කරන තල්පතකි. (...............)

**29.** ඇන්ග්ලෝ ඉන්දියානු සම්ප්‍රදාය ලෙස විචාරකයින් හැඳින්වූයේ,

(1) උපස්ථිතිවාදී කලාවේ විධික්‍රම භාවිත කරමින් ඉන්දීය වස්තු විෂය නිරූපණයට නන්දලාල් බෝස් ගත් උත්සාහයයි.
(2) රාජ්පුට් කලාවන්ගේ ලක්ෂණ සහිතව නිර්මාණකරණයේ යෙදුණු අබනීන්ද්‍රනාත් තාගෝර් ගත් උත්සාහයයි.
(3) යුරෝපීය ශාස්ත්‍රාලිය කලාවේ විධික්‍රම භාවිත කරමින් ඉන්දීය වස්තු විෂය නිරූපණයට රාජා රවි වර්මා ගත් උත්සාහයයි.
(4) ඝණිකවාදී කලාවේ විධික්‍රම භාවිත කරමින් ඉන්දීය වස්තු විෂය නිරූපණයට ජෙමිනි රෝයි ගත් උත්සාහයයි.
(5) ජනකලා සම්ප්‍රදායෙන් ආභාසය ලබමින් නිර්මාණකරණයේ යෙදුණු අම්රිතා ෂර්ගිල් ගත් උත්සාහයයි. (...............)

**30.** සන්නිදර්ශන චිත්‍රයකින් සිදුවනුයේ,

(1) පුවත්පත් ලිපියක, කවියක හෝ කෙටි කතාවක කොටස් නිරූපණය කිරීමයි.
(2) රේඛා භාවිතය පමණක් උපයෝගී කරගනිමින් කරනු ලබන සිතුවම් නිර්මාණයයි.
(3) සාහිත්‍යමය නිර්මාණයක අර්ථය වඩා පැහැදිලි කිරීම හා ඍජුව ග්‍රහණය කර ගැනීමයි.
(4) වාණිජ දැන්වීම් සඳහා කරනු ලබන සුවිශේෂී අර්ථ නිරූපණයක් සහිත සිතුවම් නිර්මාණයයි.
(5) පුවත්පත්වල කතා නිර්මාණයේදී කතාවට අදාල කෙරෙන සිතුවම් නිර්මාණයයි. (...............)

- ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** මෙහි දැක්වෙන ථූපාරාම පිළිම ගෙයෙහි,



(1) අනුරාධපුර යුගයේ ප්‍රතිමා ගෘහ සැලැස්මට අනුව නිම වූ ප්‍රතිමා දැකිය හැකිය.
(2) ගෙඩිගේ සම්ප්‍රදායට වහලය නිමවා ගර්භගෘහය තුළ හිඳි පිළිමයක් තැන්පත් කර ඇත.
(3) ත්‍රිභංග හැඩයෙන් යුතු බුද්ධ ප්‍රතිමාවක් ගර්භගෘහය තුළ පිහිටුවා ඇත.
(4) ප්‍රතිමා ගෘහයේ අන්තරාලයේ දෙපස ජාතක කතා සිතුවමට නගා ඇත.
(5) අභ්‍යන්තර සැකැස්ම අනෙක් ප්‍රතිමා ගෘහයන් ට වඩා සුවිශේෂී වෙනසක් දැකිය හැකිය. (...............)

**32.** මෙම වාස්තු විද්‍යාත්මක නිර්මාණය පිළිබඳ ගල්පොත සෙල්ලිපියේ සඳහන් වන්නේ,



(1) භාවනා කිරීමට හා දළදා වහන්සේට වන්දනා කිරීමට යොදාගත් බවයි.
(2) පිරිත් ශ්‍රවණයට හා භාවනා කිරීමට යොදාගත් බවයි.
(3) ධර්මය ශ්‍රවණයට හා සක්මන් භාවනා කිරීමට යොදාගත් බවයි.
(4) පිරිත් ශ්‍රවණයට හා ධර්මය දේශනා කිරීමට යොදාගත් බවයි.
(5) ධර්මය ශ්‍රවණයට හා දළදා වහන්සේට වන්දනා කිරීමට යොදාගත් බවයි. (...............)

**33.** මෙහි දැක්වෙන සාංචි තොරණෙහි,



(1) තොරණ අශෝක යුගයේදී ලීයෙන් කර පසුව සාතවාහන යුගයේදී ගලින් කර ඇත.
(2) සෑම ස්ථානයක ම බුද්ධ චරිතයේ සිද්ධි හා ජාතක කතා කැටයමට නගා ඇත.
(3) උතුරු තොරණ කලාත්මක අතින් උසස් අතර ඇතුල් පැත්තේ පමණක් කැටයම් ඇත.
(4) ජාතක කතා නිරූපණයේ දී විස්තරාත්මකව කැටයම් කිරීමට ශිල්පියා යොමු වී ඇත.
(5) තොරණ හා කැටයම් එකම අවධියක එකම ශිල්පී කණ්ඩායමක් විසින් කර ඇත. (...............)

**34.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



(1) පොළොන්නරුවේ පාණ්ඩ්‍ය පාලන සමයේ ඉදි කරන ලද ශිව දේවාලයයි.
(2) රාජ රාජ විසින් සිය බිසව වෙනුවෙන් පොළොන්නරුවේ ඉදිකරන ලද ශිව දේවාලයයි.
(3) ද්‍රවිඩ පාලන සමයේ පොළොන්නරුවේ ඉදිකරන ලද අංක 2 ශිව දේවාලයයි.
(4) පොළොන්නරුවේ රාජේන්ද්‍ර චෝල විසින් ඉදිකරන ලද අංක 1 ශිව දේවාලයයි.
(5) රාජේන්ද්‍ර චෝල සිය යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස පොළොන්නරුවේ ඉදිකරන ලද දේවාලයයි. (...............)

**35.** මෙම දේවස්ථානය,



(1) ජ්‍යාමිතික හැඩ බහුල ආකෘති අනුව ඉදිකර ඇත.
(2) දෙවන අවස්ථාවේ දී වෙනත් ස්ථානයක ස්ථාපිත කර ඇත.
(3) නයිල් නදියේ බටහිර නිම්නයේ ඉදි කර ඇත.
(4) ප්‍රධාන වශයෙන් දේවස්ථාන හයකින් යුක්තව ඉදි කර ඇත.
(5) සූර්ය දිව්‍ය සංකල්පයට අනුව නයිල් නදියේ ඉදිකර ඇත. (...............)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම ඇඳි ශිල්පියා හා ඔහුගේ සිතුවම් අයත් කලාව වන්නේ,

(1) පැබ්ලෝ පිකාසෝ - ඝණිකවාදී කලාව.
(2) වසිලි කැන්දිනෙස්කි - වියුක්තවාදී කලාව.
(3) වින්සන්ට් වැන්ගෝ - පශ්චාත් උපස්ථිතිවාදී කලාව.
(4) සැල්වදෝර් ඩාලි - අධිතාත්විකවාදී කලාව.
(5) එඩ්ගා ඩෙගා - උපස්ථිතිවාදී කලාව. (...............)

**37.** මෙම සිතුවම සඳහා වස්තු විෂය වී ඇත්තේ,

(1) ප්‍රංශයේ මධ්‍යම පාන්තික ගැමි පවුලක පිරිසක් තම රාත්‍රී ආහාරය ගැනීමට සූදානම් වන අවස්ථාවකි.
(2) කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස දුෂ්කර ජීවිතයක් ගත කල ගොවි පවුලක් රාත්‍රි ආහාරය ගන්නා අවස්ථාවකි.
(3) දෙවන ලෝක යුද්ධයෙන් පීඩාවට පත් ගැමි පවුලක් දුෂ්කර ලෙස සපයාගත් රාත්‍රී ආහාරය ගන්නා අවස්ථාවකි.
(4) ප්‍රභූ පාන්තික පිරිසක් ඔවුනොවුන් සමඟ කතාබහේ නිරත වෙමින් රාත්‍රී ආහාරය ගන්නා අවස්ථාවකි.
(5) බාසිලෝනා නගරයේ වීදිසරණ වීදි මිනිසුන් පිරිසක් තම ආහාරය ගැනීමට සූදානම් වන අවස්ථාවකි. (...............)

**38.** මෙම සිතුවමෙහි වර්ණ භාවිතය මඟින්,

(1) සාමාන්‍ය ජන ජීවිතයේ ස්වභාවය පෙන්වීමට කළු, අළු, සුදු වැනි වර්ණ යොදාගෙන ඇත.
(2) කළු වර්ණය වැඩි වශයෙන් ගෙන රාත්‍රි කාලය හා අඳුරු පසුබිමෙන් තේමාව අර්ථවත් කර ඇත.
(3) මධ්‍යම පාන්තික පවුලක සාමාන්‍ය දිවි පෙවෙත විස්තර කිරීමට අඳුරු පසුබිමක් යොදාගෙන ඇත.
(4) ප්‍රභූ පවුලක් හා ඔවුන්ගේ ඇඳුම් පැළඳුම්වල ස්වභාවය වර්ණ භාවිතය මඟින් වඩාත් තීව්‍ර කරයි.
(5) අඳුරු වර්ණ මාලාවකින් ගොඩනගන ලද ගොවි ජීවිතයේ දුක්ඛිත භාවය නිරූපණය කරයි. (...............)

**39.** මෙම ශිල්පියාගේ නිර්මාණ භාෂාව ගොඩනැගී ඇත්තේ,

(1) වස්තූන්ගේ ප්‍රකෘති ස්වරූපයෙන් නොව ශිල්පියාගේ බාවාත්මක ආවේගයන්ගෙන් පැන නැගුණු අඛණ්ඩ චලිත මාලාවකිනි.
(2) වර්ණ පදාස භාවිතය හා හිතුවක්කාරී ලෙස හැඩ ගැලපීම චිත්‍රයට පාදක වන වස්තූ අතර පැහැදිලි වෙනස අපැහැදිලි කිරීමයි.
(3) ස්වභාව ධර්මය හෝ එහි වස්තූන් හෝ ඒ ආකාරයෙන් ම අනුකරණය හෝ නැවත ප්‍රතිනිර්මාණය හෝ අතහැර දැමීමයි.
(4) එකම තේමාව පුන පුනා ඇඳීම වර්ණ පිළිබඳ විවිධ අත්හදා බැලීම් බහු වර්ණයන්ගෙන් යුක්ත සෙවනැලි දැක්වීමයි.
(5) පැහැදිලිව හඳුනාගත හැකි වේගවත් පින්සල් පහරවල් ස්වභාවික ආලෝකය හා ස්වාභාවික ලෝකය විෂය වීමයි. (...............)

**40.** මෙම සිතුවම ඇඳි ශිල්පියාගේ තවත් සිතුවමක් වන්නේ,

(1) ඉරි තැලුණු බිත්තිය සහිත නිවස.
(2) ඇපල් වට්ටිය.
(3) තරු පිරි රැය.
(4) කහ පැහැති ක්‍රිස්තු.
(5) දෙවියන්ගේ දිනය. (...............)